# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2146/25 - 2019 ඔක්තෝබර් මස 22 වැනි අඟහරුවාදා - 2019.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : පීඑස්/සීඑස්ජ්/00/1/14/8

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

1. ගරු ජනක් ද සිල්වා මැතිතුමා, අභියාචනාධිකරණ විනිශ්චයකාර
2. ගරු නිශ්ශංක බන්දුල කරුණාරත්න මැතිතුමා, අභියාචනාධිකරණ විනිශ්චයකාර
3. ගරු නිහාල් සුනිල් රාජපක්ෂ මැතිතුමා, විශ්‍රාමික අභියාචනාධිකරණ විනිශ්චයකාර
4. ගරු අතපත්තු ලියනගේ බන්දුල කුමාර අතපත්තු මැතිතුමා, විශ්‍රාමික මහාධිකරණ විනිශ්චයකාර
5. ඩබ්ලිව්. එම්. එම්. ආර්. අදිකාරී මහත්මිය, විශ්‍රාමික අමාත්‍යාංශ ලේකම්

වෙත,

සුභාශිංසන පූර්වකවයි !

පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වැනි අධිකාරය වූ) 2 වැනි වගන්තියෙහි විධිවිධානයන්ට අනුකූලව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මවිසින්, 2019 ක් වූ සැප්තැම්බර් මස 20 වැනි දිනැති අධිකාර පත්‍රය මගින්, 2019 අප්‍රේල් මස 21 වැනි දින කොළඹ කොච්චිකඩේ, මීගමුව කටුවාපිටිය යන කතෝලික දේවස්ථානවල, මඩකලපුව සියෝන් ක්‍රිස්තියානි දේවස්ථානය සහ කොළඹ පිහිටි ප්‍රධාන හෝටල් කිහිපයක සිදු වූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාර හේතුකොටගෙන, පුද්ගලයින් විශාල පිරිසකට මාරාන්තික තුවාල සිදුවීම්, පූර්ණ ආබාධිත තත්ත්වයට පත්වීම්, ජීවිත අහිමිවීම් මෙන්ම විශාල දේපළ ප්‍රමාණයකට අලාභ හානි සිදුවීම් පිළිබඳව විමර්ශනය හා පරීක්ෂණය කිරීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබ ඇති හෙයින් ද,



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මෙම පරීක්ෂණයන් හා විමර්ශනයන්හීදී පැවරී ඇති කාර්යය භාරය ඵලදායීව ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව වෙත අතිරේක බලතල අවශ්‍ය බවට කොමිෂන් සභාව විසින් ඉල්ලීමක් කරනු ලැබ ඇති හෙයින් ද,

2008 අංක 16 දරන පනතින් සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය) 8 (1) (අ) සහ (ආ) වගන්තිය යටතේ නිශ්චිත වශයෙන් දක්වා ඇති බලතල ද මෙම කොමිෂන් සභාව වෙත මවිසින් තවදුරටත් පවරා දෙනු ලබන බව මෙයින් දන්වා සිටිමි.

ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථ්‍යය හා පක්ෂපාතීත්වය ගැන මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින් පූර්වෝක්ත අධිකාර පත්‍රය මගින් පිහිටුවනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ එකී අධිකාරි පත්‍රයෙහි දක්වා ඇති කාර්යයන් ක්‍රියාවට නංවනු පිණිස අවශ්‍ය විය හැකි සියළුම පියවර ගන්නා මෙන් ඔබතුමන්ලාට මම මෙයින් නියම කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් දහනවයක් වූ ඔක්තෝබර් මස 18 වැනි දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

උදය ආර්. සෙනෙවිරත්න,
ජනාධිපති ලේකම්.

11 - 727

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.